# බුද්ධ ප්‍රතිමාවන්හි ඇති හස්ත මුද්‍රා තුළ පවතින සන්නිවේදනාර්ථ පිළිබඳ සංඥාර්ථවේදී විශ්ලේෂණය

**අසිත මල්ලවආරච්චි**
කථිකාචාර්ය, මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය, රජරට විශ්වවිද්‍යාලය
asithaprabhath@ymail.com/asithaprabhath@gmail.com

**සාරාංශය**

සාම්ප්‍රදායයික සමාජය තුළ අපට හමුවන නිර්වාචික සන්නිවේදන ක්‍රම පිළිබඳව අධ්‍යයනය කර ඇති මෙම පර්යේෂණයේ මූලික අරමුණවූයේ වශයෙන් බුද්ධ ප්‍රතිමාවන්හි පවතින හස්ත මුද්‍රා තුළින් අර්ථවත් කරනු ලබන සන්නිවේදනාර්ථ සංඥාර්ථවේදීව හඳුනා ගැනීමයි. බුද්ධ ප්‍රතිමා ක්ෂේත්‍රයට අදාළව පවතින හස්ත මුද්‍රාවන් තුළින් සන්නිවේදනය කරන්නේ කුමක්ද යන්න පිළිබඳ විමර්ශනය කිරීමට අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමවේදය, ගුණාත්මක පර්යේෂණ විධික්‍රමය ඔස්සේ මානවවංශ ක්‍රමවේදය විමර්ශනයට ලක් කර ඇත. හස්ත මුද්‍රා තුළ පවතින සන්නිවේදනාර්ථ පිළිබඳ සංඥාර්ථවේදී විශ්ලේෂණය යන පර්යේෂණයට අදාළව දත්ත විශ්ලේෂණය සංඥාර්ථවේදී විශ්ලේෂණය ඔස්සේ අන්තර්ගත විශ්ලේෂණයට ලක්කරමින් එහි පවතින සමානකම් හා වෙනස්කම් විග්‍රහාත්මකව අධ්‍යයනය කර නිගමනවලට එළඹ ඇත.
**මුඛ්‍ය පද** - හස්ත මුද්‍රා, සන්නිවේදනය, සන්නිවේදනාර්ථ, සංඥාර්ථ, බුද්ධ ප්‍රතිමා

**හැඳින්වීම**

සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රමවේද අධ්‍යයනය කිරීමේ දී එය මානව විද්‍යාත්මක, මනෝවිද්‍යාත්මක හා සන්නිවේදන විද්‍යාත්මක වශයෙන් අර්ථ හඳුනාගැනීම ඉතා වැදගත්වේ. සාම්ප්‍රදායයික සන්නිවේදනය සංස්කෘතික පර්යාලෝකනයක් ඔස්සේ විශ්ලේෂණය කරන විට එහි ඉතිහාසය, සාහිත්‍ය පිළිබඳව අවධානය යොමු කළ යුතුය. එවිට සාම්ප්‍රදායයික සමාජය තුළ අපට හමුවන නිර්වාචික සන්නිවේදන ක්‍රම පිළිබඳව අධ්‍යයනය කර ඇති මෙම පර්යේෂණය මූලික වශයෙන් හස්ත මුද්‍රා පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කර ඇත. මුද්‍රා යන්න සළකුණට නමකි. අජීවී, සජීවී සෑම වස්තුවක්ම හැඟවීම සඳහා විශ්ව ව්‍යාප්ත භාෂාවක් ලෙස මෙම සංඥා ක්‍රමය භාවිත කරනු ලැබේ. භාෂාවක් නොතිබූ මුල් මානව යුගයේදී මිනිසා තමාගේ හැඟීම් ප්‍රකට කළේ අංග සංඥා මගිනි. අනෙකා හා අදහස් උදහස් හුවමාරු කරගැනීම සඳහා මිනිසාගේ විශිෂ්ටතම නිර්වාචික භාෂා මාධ්‍ය වූ මෙම අංග චලනයන් ඔහු සංස්කෘතියෙහි පෙරමඟට යොමු කරවා සෞන්දර්යෙන් යුක්ත භාෂාවක් දක්වා වර්ධනය කර ඇත. මිනිසාගේ අංග චලනයන් නෘත්‍යයක් බවට පත් කිරීමේදී මෙම සංඥාවන් "හස්ත මුද්‍රා" නමින් තමන්ටම අවශ්‍ය තත්ත්වය තහවුරු කරගෙන ඇත. පාත්‍ර වර්ගයාගේ අභ්‍යන්තරික පරිස්ථිතිය පිළිබිඹුවන ප්‍රධාන ප්‍රකාශනය වූ මෙම මුද්‍රා පසුකාලීනව වෙනම නර්තන සම්ප්‍රදායයක් ලෙස ද වර්ධනයවී ඇත.

**හස්ත මුද්‍රා යනු**

සංස්කෘතික ලක්ෂණ විදහාපාමින් අභිනය මගින් අර්ථයක් ප්‍රකාශ කිරීම සඳහා අප හස්ත මුද්‍රා භාවිත කරන්නෙමු. ශරීර භාෂාව තුළ "අතට" හිමිවන්නේ සුවිශේෂි ස්ථානයකි. ඇතැම් විට වචනයෙන් තොරව පුළුල් දෙයක් ප්‍රකාශ කිරීම සඳහා අපට හස්ත මුද්‍රා භාවිත කළ හැකිය. "හස්ත මුද්‍රා යනු අන්අය සමඟ තොරතුරු බෙදාගැනීම සඳහා භාවිත කරනු ලබන නිර්වාචික සන්නිවේදන ක්‍රමයක් ලෙස සරලව හැඳින්විය හැකිය. එමෙන්ම විවිධ සංස්කෘතික අර්ථ ගැබ්ව ප්‍රකාශ කළ හැකි සරල මාධ්‍යයක් ද වේ. කොල්ගේට් විශ්වවිද්‍යාලයේ (Colgate University) මනෝ විද්‍යාව හා භාෂාව පිළිබඳ මනෝ විද්‍යාඥයෙකුවන Spencer Kelly ට අනුව "Gestures are not merely add-ons to language- they may actually be a fundamental part of it"

විශේෂයෙන්ම හස්ත මුද්‍රාවලදී ඇඟිලි, මැණික් කටුව, බාහු හා ඉහළ අත යන අංග චලනය කිරීමෙන් හස්ත මුද්‍රා සකස් කරගනු ලැබේ. වරෙක එක් අතක් හෝ අත් දෙකම භාවිත කර ගැනීමෙන් හස්ත මුද්‍රා සකස් කරගත හැකිය. එකම මුද්‍රාවක් ගතහොත් එම මුද්‍රාව භාවිතවන අවස්ථාව හා විෂය ක්ෂේත්‍රය අනුව විවිධ අර්ථ ප්‍රකාශ කළ හැකිය. සංස්කෘතිය, සමාජීය ආදී සාධකයන් ද මෙහිදී බලපෑමට ලක්වේ.

**සංඥාර්ථවේදය**

මූලික සංකල්පයක් ලෙස සංඥාර්ථවේදය, සංස්කෘතික ව්‍යුහයකි. නූතන සංඥාර්ථවේදී සංකල්පය ඉදිරිපත් කිරීමේ පුරෝගාමීන් ලෙස සලකන්නේ Ferdinande de Saussure iy Charlses S. Peirce යන දාර්ශනිකයන් දෙදෙනාය. සමාජ සංස්කෘතික සංසිද්ධීන් අර්ථවත් කිරීමේදී සංඥා උපයෝගි කරගන්නා ආකාරය ඔවුන්ගේ අධ්‍යයන තුළින් මනාව පැහැදිලි කොට ඇත. භාෂාව යනු අදහස් ප්‍රකාශ කිරීම සඳහා භාවිත කරනු ලබන සංඥා පද්ධතියක් බවත්, එය ලේඛන පද්ධතියක් දක්වා වර්ධනය වූ ආකාරයත් Saussure ish Course of General Linguistics ග්‍රන්ථයෙන් පැහැදිලි කර ඇත.

ඉංග්‍රීසි භාෂාවෙන් සංඥාර්ථ විද්‍යාව හැඳින්වීමට යෙදෙන "Semiotic" යන්න ග්‍රීක වචනයක්වූ "Semeion" යන්නෙන් බිඳී ආවකි. "Semeion" යන්නෙහි අර්ථය වන්නේ "සංඥාව" යන්නයි. ඒ අනුව, "සංඥාර්ථ විද්‍යාව යනු සංඥා පද්ධතීන් පිළිබඳව අධ්‍යයනය කරනු ලබන විෂයපථයක්" ලෙස සරලව දැක්විය හැකිය. සංඥාර්ථවේදී විද්‍යාවේදී සංඥා ක්‍රියාවලිය, සන්නිවේදනය, සංකේත සහ සංඥා පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කෙරේ. මේවා මගින් අර්ථ ජනනයවන ආකාරය, අර්ථ සැකසී ඇති ආකාරය සහ අප ඒවා වටහා ගන්නා ආකාරය අධ්‍යයන කිරීම සංඥාර්ථ විද්‍යාවේ මූලික අරමුණ ලෙස පෙන්වා දීමට පුළුවන.

"සංඥාවල ස්වාභාවය, සංඥාවල ප්‍රභේද හා කාර්යයභාර්ය, සංඥාමය පද්ධති, මිනිසාගේ සංඥාමය ක්‍රියාකාරීත්වය අධ්‍යයනය කරනු ලබන විද්‍යාත්මක විෂයයකි" (වීරසිංහ, 2012, පිටුව 02). එමෙන් ම ස්වාභාවික භාෂාවන්ගේ මෙන් ම නිර්මාණය කරන ලද කෘත්‍රිම භාෂාවල පවතින සංඥාවන් පිළිබඳව අධ්‍යයනය කිරීමද සංඥාර්ථ විද්‍යාවට ඇතුළත්වේ.

සංඥාවක් හඳුනාගැනීම සෑමවිටම ද්විරූපීයව පවතී.




සංඥාපිතය හෙවත් හැඟවුම යනු යම් අදහසක්, ද්‍රව්‍යයක් හැඟවීම සඳහා භාවිත කරන මෙවලම හෝ මාධ්‍යයයි. මෙය සංඥාවක්, සංකේතයක් හෝ වෙනත් ඕනෑම මාධ්‍යයක් විය හැකිය. සංඥාපකය හෙවත් හැඟවුම්කාරකය යනු උක්ත මාධ්‍ය භාවිතයෙන් ප්‍රකාශ කරන අර්ථයයි. මෙම අර්ථ ගැන්වීම සඳහා සංස්කෘතික පසුබිම, අත්දැකීම් පසුතලය තදින්ම හේතුවන බව ප්‍රකාශ කළ හැකිය.

## බුද්ධ ප්‍රතිමා හා හස්ත මුද්‍රා

ප්‍රතිමා යන්නෙන් අදහස් වන්නේ විශේෂයෙන් පිදීම සඳහා යොදා ගනු ලබන නැතහොත් විවිධ ඇදහිලිවලට සම්බන්ධවූ ශාස්තෲවරයෙකු හෝ දේවතාවකු නිරූපණය කරනු ලබන මූර්තියකි. චිත්‍ර, මූර්ති හෝ කැටයම් වැනි කලා මාධ්‍යවල මාර්ගයෙන් මෙබඳු ප්‍රතිමා නිර්මාණය කරනු ලැබේ. "ග්‍රීක "අයිකොන්" යන්නෙන් ද ඉන්දීය අර්චා, බෙර, විග්‍රහ වැනි වචනවලින් ස්ථිර ලෙසම ධ්වනිත වන්නේ භක්තිකයන්ගේ පුද පූජාවලට භාජනයවන ඍෂිවරයෙකු හෝ දෙවියෙකු නිරූපණය කරන මූර්තියකි. ප්‍රධාන වශයෙන් මෙවැනි මූර්ති මනුෂ්‍යත්වාරෝපිත හෝ සත්ත්වරූපී නිරූපණ වුවත් සමහර විට එබඳු ස්වරූපයකින් තොර සංකේතික නිරූපණ වුවද ප්‍රතිමා ගණයට අයත් වේ" (Banerjea, J.N, 1956, Page 01) ආගමකට සම්බන්ධවූ පමණින්ම මූර්තියක් ප්‍රතිමාවක් නොවේ. ශාස්ත්‍රානුකූලව ප්‍රතිමා ලක්ෂණ යොදා තනා ඇති මූර්තිය පිදීමට සුදුසුවන අතර එබන්දක් ප්‍රතිමා නමින් හැඳින්වීමට පුළුවන.

"මූර්ති කලාව හෝ ප්‍රතිමා ශිල්පයේ දී කුමන හෝ ආගමික සංසිද්ධියක් සංකේතාත්මකව දැක්වීම පිණිස නැතහොත් විවිධ ශාස්තෲවරුන් දෙවි දේවතාවන් හෝ බෝධිසත්ත්වවරයන් එකිනෙකාගෙන් හෝ එකිනෙක ස්වරූපයෙන් වෙන්කර හඳුනාගැනීම පිණිස අත්වලින් නිරූපණය කරන විශේෂ ස්වරූපය මුද්‍රා නමින් හැඳින්වේ" (ලගමුව, 1999,142 පිටුව). එක් එක් ප්‍රතිමාවකට විශේෂ වූ මුද්‍රා ඇති අතර එය එම ප්‍රතිමාව හඳුන්වාදෙන විශේෂ ලක්ෂණය ද වන්නේය. එසේම එමගින් ශිල්පියා අපේක්ෂා කරන අදහස ද සංකේතවත් කරයි. ප්‍රතිමා කතා කරනු ලබන්නේ හස්ත මුද්‍රාවෙනි. මේ අනුව "අතීතයේ සිට භාවිතවූ මේ හස්ත මුද්‍රා හින්දු ප්‍රතිමා විෂයයෙහි 64ක් පමණ තිබෙන අතර එයින් බුද්ධ ප්‍රතිමා සඳහා උපයෝගි කරගෙන ඇත්තේ ඉතා සීමිත සංඛ්‍යාවකි" (ධම්මදස්සි හිමි, 2010, 34 පිටුව).

"ලංකාවේ බුදු පිළිමය හා මුද්‍රා පිළිබඳව පළමු වැනි සටහන හමුවන්නේ ථූප වංශයෙනි. එම සඳහන දෙවන පෑතිස් රජුගේ කාලය දක්වා විහිද යයි" (ගමගේ, 1984). ජපන් බුදු පිළිමයන්ගේ මුද්‍රා තුළින් බොහෝ දුරට නිරූපණය වන්නේ බුද්ධ ධර්මයේ දාර්ශනික සංකල්පයක් වීම වැදගත් කරුණකි. බුදු පිළිම තෙළු ජපන් නිර්මාණ ශිල්පීහු බෞද්ධ දර්ශනයේ උතුම් අංග ඉතා සියුම් ලෙස මුද්‍රා මගින් සංකේතවත් කර ඇත. සොන්ඩර්ස් දක්වන ආකාරයට "බුදුරජාණන්වහසේ දැත විශ්වය නිරූපණය කරයි. දකුණින් සූර්යයා ද, වමතින් චන්ද්‍රයා ද නිරූපිතය. ඇඟිලි දහයෙන් දස චක්‍ර (රෝද) දශාංශක හෝ දශ පද්ම නිරූපිතය. දකුණින් ඥාන මණ්ඩලය ද වමතින් ධ්‍යානය ද නිරූපිත බව තවත් අදහසකි. දකුණතෙහි ඇඟිලි පහෙන් පංච මහා භූතයන් පිළිබඳ යථාර්තය ඇතැඹුලක් සේ දැනගත් අයුරු ද, වමතෙහි සුළැඟිල්ලෙන් දානය ද, වෙදැඟිල්ලෙන් විනය ද, මැඳගිල්ලෙන් අග්නි ද, දබරගිල්ලෙන් සුළඟ ද, මහපටගිල්ලෙන් ශූන්‍ය බවද" නිරූපණය කර ඇති බව සොන්ඩර්ස් ගේ මතයයි (ගමගේ, 1984).



එසේම දෑතෙහි සෑම ඇඟිලි පුරුකක් පාසාම කිසියම් අරුතක්, සංකේතයක් ගැබ්කර ඇති බව මෙම මුද්‍රා පිළිබඳව පුළුල්ව අධ්‍යයනය කිරීමේදී පෙනී යයි. "මෙත්තාව, උපේක්‍ෂාව, මුදිතාව මෙන්ම යටි සිතේ පැවැත්ම, ආශිර්වාදය, පරිකල්පනය, පිළිවෙත, සම්බෝධිය, විමසීම, තර්කය, සමානාත්මතාව වැනි ගුණාංග ඉන් දක්වා ඇත" (ගමගේ, 1984, පිටුව 12). දකුණතින් සූර්යයා නිරූපිතය යන්නට මෙවැනි අර්ථයක් ලබාදී ඇත. "සූර්යාගේ ප්‍රකාශවන්නේ සත්‍ය පිළිසිඳ ගැනීමේ දැනුම් ප්‍රභාවයි. දකුණතින් සියල්ල විනිවිද දක්නා එම දැනුම් ප්‍රභාව සංකේතවත්වේ. චන්ද්‍රයාගෙන් කැටපත් වන්නේ සෞම්‍ය වූ මුදිතා, කරුණා, උපෙක්ඛා යන ගුණයන්ය" (ගමගේ, 1984, පිටුව 12). සෑම සම්ප්‍රදායයකටම අයත් බුදු පිළිම සඳහා ප්‍රධාන වශයෙන් ඇත්තේ සමාධි, ධර්මචක්‍ර, අභය, විතර්ක, වරද හා භූමිස්පර්ෂ යන මුද්‍රා හයයි. මෙහිදී ඒ ඒ මුද්‍රාව පිළිබඳව විවිධ විද්වතුන් විසින් ඉදිරිපත් කරන ලද සන්නිවේදනාර්ථ සංඥාර්ථවේදීව විශ්ලේෂණය කර ඇත.

**සමාධි (ධ්‍යාන) මුද්‍රාව**

මෙම මුද්‍රාව හිඳි පිළිම සඳහා යොදා ගනී. වීරාසනයෙන් හෝ පද්මාසනයෙන් වැඩසිටින බුදු රජාණන් වහන්සේගේ දෑත, වම් අත්ල මත දකුණු අත්ල තබාගෙන සිටීම ධ්‍යාන හෙවත් සමාධි මුද්‍රාව ලෙස හැඳින්විය හැක. ඒ. ලගමුව දක්වා ඇති ආකාරයට සමාධි මුද්‍රාව, ධ්‍යාන මුද්‍රාව, පද්මාසන මුද්‍රාව යන නම්වලින් ද හඳුන්වනු ලැබේ. සමාධිය යනු සිතේ එකඟතාවයයි. ත්‍රිවිධ ශික්‍ෂාවන්ගෙන් දෙවන තැන හිමිවන්නේ සමාධියටයි. බෞද්ධ ප්‍රතිපදාවේ ගමන් කරන්නෙකු සීලයෙහි පිහිටා සමාධියත් ප්‍රඥාවත් වැඩිය යුතුය. ප්‍රඥාව වැඩීමට සීලය මෙන්ම සමාධිය ද අත්‍යවශ්‍යවේ. "බුද්ධ ප්‍රතිමා විෂයෙහි යෙදෙන සමාධි මුද්‍රාවෙන් හුදෙක් චිත්ත ඒකාග්‍රතාව පමණක් නොව ප්‍රඥා පාටවයෙන් ජනිතවූ ප්‍රමෝධ ලක්‍ෂණයක් තිබිය යුතුය. වෙනත් ආකාරයකින් ප්‍රකාශ කළහොත් නිකෙලෙස් ලොව්තුරා ගුණය එහි ගැබ්විය යුතුය. බුද්ධත්වය සංකේතවත් කරන සමාධි හෙවත් ධ්‍යාන මුද්‍රාවෙන් නිමවන ලද බුද්ධ ප්‍රතිමාව තුළින් උන්වහන්සේගේ අපරිමිත මහා කරුණාව මූර්තිමත් කෙරේ. ඒ සමඟම ඉතා ගැඹුරුවූත් සූක්ෂමවූත් ධ්‍යානයට සමවන් විලාසයෙන් පරම ගාම්භීරවූ ප්‍රඥා මහිමය ප්‍රකට කෙරේ" (ධම්මදස්සි හිමි, 2010, පිටුව 35). සමාධි මුද්‍රාවෙන් නෙළූ බුද්ධ ප්‍රතිමා විශාල සංඛ්‍යාවක් ලංකාව පුරා ඇත. අනුරාධපුර මහමෙව්නා උයනේ ඇත්තේ ලෝක ප්‍රකට සමාධි බුද්ධ ප්‍රතිමාවයි. "මෙම මුද්‍රාවෙන් කියැවෙන්නේ අනන්ත අප්‍රමාණ වාර ගණනක් සංසාර චක්‍රයේ සැරිසරමින් සිටි බෝ සතුන් බුද්ධත්වයට පත් වූ උත්තරීතර අවස්ථාවයි. ඇසතු රුක් සෙවනේදී ධ්‍යාන වඩා සම්මා සම්බුද්ධ ඥානය අවබෝධකරගත් අවස්ථාව මින් නිරූපිතය. සමාධිමය අවස්ථාව දැක්වෙන මෙම මුද්‍රාවෙන් අධ්‍යාත්මික ඒකාග්‍රතාව ද පිළිබිඹු වේ" (ධම්මදස්සි හිමි, 2010, පිටුව 35).

අල්ල උඩට පිහිටන සේ වම් අත තබා ඒ මත අල්ල උඩට සිටින සේ දකුණු අත තබාගෙන කඳ කෙලින් තබාගෙන සිටිති. භාවනා කරන විට ද මේ අන්දමට අත් තබාගෙන සිටීම සිරිතකි. ධ්‍යානවලට සමවැදී ඉන්නා අවස්ථාව ද මීට සමාන බැවින් ධ්‍යාන හා සමාධි යන වචන දෙකම මේ මුද්‍රාව හැඳින්වීමට සුදුසු බව චන්ද්‍රා වික්‍රමගේ දක්වා ඇත. සමාධියට සමවන් යෝගියෙකු තුළ තිබිය යුතු බාහිර ලක්‍ෂණ "නිසීදති පල්ලංකං ආභුජිත්වා උජුං කාය පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා" (ධම්මදස්සි හිමි, 1997, පිටුව 35) යනුවෙන් දක්වා ඇත. එහි අර්ථය වන්නේ පලක් බැඳ ඍජු කයෙන් යුතුව කමටහනට යොමු වූ සිත් ඇතිව සිටීමය. "බුද්ධඝෝෂ හිමියෝ 'පල්ලංකං' යන්ට ඌරුබද්ධ ආසනය ලෙසත් කමටහනට යොමුවූ සිත යන්න නාසයේ කෙළවරට විළුඹට හා මහපට ඇඟිල්ලට හෙළු නෙතින් යුතුව සිටීම ලෙසත් පෙන්වා දෙයි" (ධම්මදස්සි හිමි, 1997, පිටුව 35).

සොන්ඩර්ස් දක්වන පරිදි "මහායාන සම්ප්‍රදායේ බුදුන් වහන්සේ නාගයන් මුදා ගැනීම ධ්‍යාන මුද්‍රාවෙන් සංකේතවත් කරයි. ධ්‍යානි බුදුවරුන්ගේ අමෝඝසිද්ධි බුදුන්වහන්සේට හිමි මුද්‍රාව මෙයයි" (Saunders, A, 1960, page 88). නමුත් සොන්ඩර්ස්ගේ මතය ධ්‍යානි බුදුවරුන්ට පමණක් මෙම මුද්‍රාව පවතින්නේ නැත. වෙනත් බුදුවරුන් ද මෙම මුද්‍රාවෙන් දක්වා ඇත. ලංකාව තුළ සමාධි බුද්ධ ප්‍රතිමාවට විශේෂ ස්ථානයක් හිමිවීමට අවශ්‍ය පසුබිමක් ද ඇත. "බුදුරජාණන්වහන්සේ

මහියංගණයට වැඩි ප්‍රථම අවස්ථාවේ ආකාශයේ වැඩ සිටියේ පැළක් බැඳ ගෙන සමාධිගතව බව සාහිත්‍ය ග්‍රන්ථවල සඳහන්වේ. එමෙන් ම දෙවන වර නාගදීපයේ දී මිණිපළඟ පරිහරණය කළේ ද සමාධි සුවයෙන් හිඳිමිනි. තෙවන ගමනේ දී දීඝවාපිය වැනි ස්ථාන පරිභෝග කළේ ඒ ඒ ස්ථානයන්හි සමාධි සුවයෙන් කල් යවමින් ය'' (ධම්මදස්සි හිමි, 1997, පිටුව 36). මේ නිසාම සිංහල බෞද්ධයා තුළ සමාධි බුද්ධ රූපය පිළිබඳ පූර්ව සංකල්පයක් පැවති බව උපකල්පනය කළ හැක. එම නිසා සමාධි මුද්‍රාවෙන් බුදු කෙනෙකුගේ ලෝකෝත්තර චිත්ත සමාධිය එක් අතකිනුත් අනෙක් අතින් වඩාත් සංවර්ධිත අදහස වශයෙන් බුද්ධත්වයත් සංකේතවත් කරනු ලබයි.

එමෙන්ම අනෙක් අතට "කලාකරුවා මූලික වශයෙන් අඟවන්නට උත්සහ දරා ඇත්තේ බුදුන් වහන්සේ විවේකීව වැඩසිටින හැම අවස්ථාවකදීම බාහිර අරමුණුවලින් තොරව නිවන පිළිබඳව සිත යොමු කොට සැහැල්ලු මනසකින් වැඩසිටින බවයි" :සුමනජෝති හිමි, 1997, පිටුව 55). දීඝ නිකායේ සතිපට්ඨාන සූත්‍රය මේ ඉරියව්ව විස්තර කර තිබෙන්නේ. "ඉධ භික්ඛවේ භික්ඛු අරඤ්ඤ ගතොවා රුක්ඛ මූල ගතොවා සුඤ්ඤාගාර ගතොවා නිසිදත් පල්ලංකං ආභු ජිත්වා උජුං කායං පණිධාය, පරිමුඛං සතිං උපට්ඨපෙත්වා, සො සතොව අස්සති'' යනාදී වශයෙනි. සමාධි ඉරියව්වේ ද අල්ප ශබ්දතාව, ගණසංගණිකාවෙන් තොර බව, හුදෙකලා බව, අල්ප කෘත්‍යතාව, සැහැල්ලු බව ආදී වශයෙන් පාරිසරික යෝග්‍යතාව අතිශයින්ම අවශ්‍යය. එම නිසා භාවනානුයෝගියා ආරණ්‍යයක් හෝ වෘක්ෂ මූලයක් හෝ සූන්‍යාගාරයක් හෝ සත්පාය ස්ථානයක් වශයෙන් සකස් කර ගත යුතුය. එබඳු උචිත ස්ථානයක් නොලැබුණහොත් භාවනාව හා විවේකය සාර්ථක නොවේ. යෝගියා ඉහත කී පරිදි අත්පා ක්‍රමවත්ව තබාගෙන සමාධි පරියංකයෙන් වැඩ සිටිමින් කය ඍජුව තබාගෙන, සතිය පෙරටු කොටගෙන ආශ්වාස ප්‍රාශ්වාස කළ යුතු බව ඉහත පාලි පාඨයෙන් කියවේ" (සුමනජෝති හිමි, 1997, පිටුව 55).

මේ අනුව මෙම මුද්‍රාව පමණක් නොව මෙම ඉරියව්ව ද සමාධි ඉරියව්ව ලෙස හඳුන්වනු ලැබේ. ධ්‍යාන වඩන්නා සිටිය යුතු ඉරියව්ව සමාධි ඉරියව්වවේ. ග්‍රාහකයාට සැබෑ ලෙසට මෙකී කාරණාව ධ්වනිත වන්නේ ද යන්න මීළඟට විමසා බැලිය හැකිය. එහිදී ඉන්දියාවේ ජවහල් ලාල් නේරුතුමා සිරගතවී සිටි අවස්ථාවේ දී අනුරාධපුර සමාධි බුදුරුවේ පින්තූරයක් බලා "මෙම බුදු පිළිමයෙහි ශක්තිමත් ශාන්ත ලක්ෂණයක් මා සනසා මට ධෛර්ය දී මා පිළිබඳ ඇති වූ බොහෝ අධෛර්යවත් කාල පරිච්ඡේදයන්හි දී මට පිළිසරණ විය'' (ධම්මදස්සි හිමි, 1997, පිටුව 36). යනුවෙන් සඳහන් කොට ඇත. නිවන කෙළවර කොට ගත් ශාරීරික හා මානසික ඒකමිතිය උපදවන සමාධිය, සමාධි මුද්‍රාවේ සංකේතවත්වන බව පටෙල්ගේ මතය ද වේ.

අනෙක් අතට මෙම සමාධි මුද්‍රාව බෞද්ධ දර්ශනයට පමණක් සීමාවූවක් නොවේ. භගවත් ගීතාව ද යෝගී ඉරියව්ව විස්තර කිරීමේදී ධ්‍යාන මුද්‍රාව පිළිබඳව සඳහන් කරයි. "ධ්‍යානි යෝගී ශිව ගේ ස්වරූපය විස්තර කරමින් පද්මාසනයෙහි ඍජු කයෙන් සිටින ශිව උඩු අතට යොමු කළ අත්ල සහිත දෑත උකුළ මත මනාව පිපුණ කුසුමක් සේ තබා සිටින්නේ යැයි කාලිදාස පවසයි" (ලගමුව, 1999, පිටුව 147). මෙම යෝගී ඉරියව්වේ විවිධ ප්‍රභේද භාරතීය මූර්ති මගින් නිරූපණය කරයි. "ක්‍රි.පූ 2-3 වැනි ශතවර්ෂවලට අයත් උජ්ජේනි තඹ කාසියක ඇති පද්ම පීඨය සහිත දේව රූපයක ධ්‍යාන මුද්‍රාවට ආසන්න ස්වරූපයකින් දෑත නිරූපණය කර ඇත" (ලගමුව, 1999, පිටුව 147).

සමාධි මුද්‍රාවෙන් ප්‍රකාශ කරනු ලබන සන්නිවේදනාර්ථ සංඥාර්ථවේදී විශ්ලේෂණයට අනුව පහත පරිදි දැක්විය හැකිය.

**විස්තරය**

මෙම මුද්‍රාවෙන් ප්‍රකාශිත ප්‍රධාන මූලික කාරණය ලෙස බෝධිසත්ත්වයන් බුද්ධත්වයට පත්වීම විග්‍රහ කරයි. එහිදී අත්තකිලමත්තානු යෝගය හා කාමසුඛල්ලානුක යෝගය යන අන්ත දෙක අතහැර මධ්‍යයම ප්‍රතිපදාව අනුගමනය කරමින් භාවනා කිරීමට යොමු විය. ඒ තුළින් කෙලෙස් ප්‍රහීන කර ගැනීමට හැකියාව ලැබුනේ චිත්ත ඒකග්‍රතාවය පවත්වාගෙන යාමෙන්ය. ඒ සඳහා

භාවනාව වැඩිය යුතුය. බුද්ධ දර්ශනයට අනුව මෛත්‍රී භාවනාව හා ආනාපානාසති භාවනාව වැඩීමට පවතින සුදුසු ආකාරය මෙම ස්වරූපයයි. ඒ බව ප්‍රකාශ කරන ආකාරය බුද්ධ චරිතය තුළින් මතු කිරීමට මෙම මුද්‍රාව යොදාගෙන ඇතිබව පැහැදිලිවේ. මෙහි අවසානය නිවන් මඟ බව ද ප්‍රකාශවේ.

**(Signified) හැඟවුම**



සමාධි මුද්‍රාව

**(Signifier) හැඟවුම්කාරකය**

- චිත්ත ඒකාග්‍රතාව
- කෙලෙස් ප්‍රහීන කිරීම
- ධ්‍යානයට සම වැදීම
- බුද්ධත්වයට පත්වීම

## ධම්මචක්ක මුද්‍රාව

බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කරන විලාසය දක්වීම සඳහා ධම්මචක්ක මුද්‍රාව උපයෝගී කර ගනී. මෙම මුද්‍රාවේ දකුණු අත්ල පිටතට හරවා පපුවේ මට්ටමට තබාගෙන එහි දබර ඇඟිල්ල හා මාපට ඇඟිල්ලේ තුඩු දෙක කවයක් සෑදෙන සේ එකට තබා ඇතුළට හැරුණු වම් අතේ ඇඟිල්ලක් ස්පර්ශ කරන අයුරින් ධම්මචක්ක මුද්‍රාව සකස්වේ. සාමාන්‍යයෙන් සාරනාත් බුදු පිළිමවල මෙම ලක්ෂණය පවතී. බුදුරජාණන් වහන්සේ බරණැස් නුවරදී පැවැත්වූ ධම්මචක්ක පවත්වන සූත්‍රය (ධම්සක් පැවතුම් සූත්‍රය) මෙම මුද්‍රාව මගින් නිරූපණය කර ඇති බව ප්‍රචලිත මතයවේ. නමුත් ආනන්ද කුමාරස්වාමි එයට වඩා වෙනස් මතයක් දක්වයි. "කෙලවරක් නොමැති සංසාර චක්‍රයේ ස්වභාවය ද අටලෝ දහම හා විශ්වයේ පැවැත්ම පිළිබඳ විද්‍යාත්මක න්‍යාය ද ඉන් නිරූපණය කරයි" (බණ්ඩාර, 1984, පිටුව 84).

ඇතැම් අවස්ථාවල මෙම මුද්‍රාව සහිත බුද්ධ ප්‍රතිමාවේ ආසනයෙහි ධර්ම චක්‍රය ද දක්වා තිබේ. පර්‍ය්‍යංකාසනයෙන් යුත් හිඳි පිළිමවල මෙන්ම ප්‍රබම්බපාද ක්‍රමයට වාඩිවී සිටින බුදු පිළිමවල ද ධම්ම චක්‍ර මුද්‍රාව දක්නට ලැබේ. ලංකාවේ මෑතක්වන තුරුම මේ මුද්‍රාවෙන් යුත් බුදු පිළිම තනා නැත. අම්බලන්තොට සියඹලාගස්විල විහාරයේ ඇති ලෝකඩ මෛත්‍රී බුදුපිළිමයේ ධම්මචක්‍ර මුද්‍රාව දක්නට ලැබේ. මෙම බුද්ධ ප්‍රතිමාව ද ඉන්දියානු නිර්මාණයක්වන අතර ගුප්ත යුගයේ ඈත භාගයට අයත් බුද්ධ ප්‍රතිමාවක් ලෙස සලකනු ලැබේ. මේ ආකාරයට දක්වෙන ධම්මචක්‍ර මුද්‍රාවෙන් නිරූපණය කරනු ලැබෙන අර්ථ මොනවා දැයි අපට විග්‍රහ කළ හැකිය. එයින් එක් අර්ථයක් වන්නේ බුදුසිරිතේ දෙවන අනුස්මරණීය සිදුවීමවන ප්‍රථම ධර්මදේශනයයි. "එය සියලු ලෝ වැසියන්ගේ විමුක්තිය හෙළි කරන්නකි. එම අවස්ථාව මුද්‍රාවකින් දක්වීම අතිශයින් උචිත වන්නේය. ඇසළ පුර පොහෝ දින බරණැස ඉසිපතනයේදී පස්වග තවුසන්ට දේශනා කළ මංගල ධර්ම දේශනය උන්වහන්සේ විසින්ම නම් කොට ඇත්තේ "ධම්මචක්ක පවත්වන සූත්‍රය" ලෙසය. එම ධර්ම දේශනය පවත්වන ඉරියව්ව පිළිබිඹු කිරීමේදී බුදුන් වහන්සේ වැඩ සිටියේ සමාධි ඉරියව්වෙනි" (ප්‍රනාන්දු, 1997, පිටුව 56). වම් පාදය නවා ඒ මත දකුණු පාදය තබා පා දෙකෙන්ම පතුල් උඩට හරවා තබාගෙන බද්ධපර්‍ය්‍යංකයෙන් හෙවත් පද්මාසන ඉරියව්වෙන් වැඩ සිටිමින්ය. ගැඹුරු දහමක් සේ පැහැදිලි කරන අයුරු මෙම මුද්‍රාවෙන් දක්වෙන බවයි. මෙම මුද්‍රාවෙන් නෙළා තිබෙන සාරනාත් බුදු පිළිමය තත්කාලීන බුද්ධ ප්‍රතිමා ශිල්පයේ අග්‍රඵලය සේ සලකනු ලැබේ. ධර්ම චක්‍ර මුද්‍රාව බොහෝ රටවල සම්භාව්‍යයත්වයට පත් මුද්‍රාවක් බව ඒ ඒ රටවල නෙලා තිබෙන බුද්ධ

ප්‍රතිමාවලින් ස්ඵුටවේ. ඉන්දියාවේ මෙන් ම වෙනත් රටවල ද මෙම ප්‍රතිමාවල සුළු සුළු වෙනස්කම් ද තිබේ.

මෙහි ධර්ම චක්‍රය යනු බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මය නොහොත් ලොව පාලනයවන ධර්ම නියාමනය බවද තවත් අර්ථ නිරූපණයකි. මේ අනුව බුදුරජාණන් වහන්සේ ධර්ම චක්‍රය පවත්වන සේක, යන්නෙන් අදහස් කරන එක් අර්ථයක් නම් උන්වහන්සේ ලෝකයට තමා අවබෝධ කරගත් ලෝකයෙහි පවත්නා යථාර්තය නැතහොත් ලෝකෝත්තර ධර්මය දේශනා කරන්නේය යන්නයි. ධර්මචක්‍ර මුද්‍රාවෙන් ඥානයේ හා ද්‍රව්‍යමය ස්වභාවයේ සංකලනයක් හෝ සත්ත්වයා අතර නිවැරදි අවබෝධය පතුරුවාලීම සඳහා බුදුන්, බෝධිසත්වවරුන් විසින් ද්‍රව්‍යමය ස්වරූපයක් ආරෝපණය කරගැනීමක්, සංකේතවත්වේ" (ධම්ම දස්සි හිමි, 2010, පිටුව 40 - 41). ධම්මචක්‍ර ලාංඡනය බුද්ධ ප්‍රතිමා නිර්මාණයට පෙර පටන් ම බුදුරජාණන් වහන්සේ වෙනුවට භාවිත කළ බව තවත් මතයකි. මුල් යුගයේ දී කිසිදු අවබෝධයකින් තොරව යෙදූ මෙම මුද්‍රාව ගුප්ත යුගයේදී ක්‍රමානුකූලව සකස්වී ඇත. එහෙයින් එම යුගයේදී ධර්මචක්ක මුද්‍රාව බෙහෙවින් ජනප්‍රිය විය. "ඉන්දු යුරෝපීයන් අතර සූර්යා හා ගින්න සංකේතවත් කිරීමේ ලාංඡනයක්වූ චක්‍රය දිගු කලක සිට ඉන්දියාවේ ගෞරවයට, සැලකිල්ලට, වන්දනාවට පාත්‍රවී තිබුණි. මෙය බුද්ධ ප්‍රතිමා නිර්මාණයට පෙර පටන්ම බුදුරජාණන් වහන්සේ වෙනුවට භාවිත කළ බව සාංචි, භාර්හුට් කැටයම්වලින් පෙනී යයි" (ධම්ම දස්සි හිමි, 2010, පිටුව 40).

එමෙන්ම මෙම ධර්මචක්‍ර මුද්‍රාවෙන් ඥාන මුද්‍රාව හා ව්‍යාඛ්‍යාන මුද්‍රාව යන සංකලනයක් පෙන්නුම් කරන බව ද දක්විය හැකිය. වමතෙහි මහපට ඇඟිල්ල එක් කොට අත්ල කය දෙසට යොමු කිරීමෙන් නිරූපණය වන්නේ ඥාන මුද්‍රාවයි. ඔසවන ලද දකුණතෙහි අත්ල පිටතට යොමු කොට මහපට ඇඟිල්ල හා දබර ඇඟිල්ල ස්පර්ශ වීමෙන් කවයක් සෑදීමෙන් නිරූපණය වන්නේ ව්‍යාඛ්‍යාන මුද්‍රාවයි. මේ ස්වරූප දෙක එක්කොට එකට යෙදීමෙන් ධර්මචක්‍ර මුද්‍රාව නිරූපණයවේ. සාමාන්‍ය ධර්මචක්‍ර මුද්‍රාව මෙසේ වුවත් වෙනත් ආකාරවල ඇඟිලි තබා නිර්මාණය කරන ලද ප්‍රතිමා හා කැටයම් රැසක් ඉන්දියාවේ හා වෙනත් රටවල දක්නට ලැබේ.

එමෙන්ම විජයසිරි අමරතුංග සිය පර්යේෂණයෙන් දක්වා ඇත්තේ "දෑතේ ඇඟිලිවලින් නවගුණ වැල ගණිත ආකාරයක් ද නිරූපණය කරන බවයි" (අමරතුංග, 1997, පිටුව 41). ඒ ලගමුව දක්වන අදහස ද මෙහිදී දක්විය හැකිය. “බෞද්ධ ආගමේ ධර්ම චක්‍රය පිළිබඳ අදහස වෛදික සූර්ය වන්දනාව පිළිබඳ අදහස් පදනම් කරගෙන ප්‍රභවය වූවකි. සමහර විට බෞද්ධ ධර්මචක්‍රයෙන් අනන්ත වූ සංසාරය ධ්වනිත වන බවද සිතිය හැක. ධර්ම චක්‍රවර්තී ලෙස බුදුන් හැඳින්වූයේ ධර්මය පිළිබඳ චක්‍රය ක්‍රියා කරවන්නා යන අදහසින්ය. ඉපැරණි භාරතීය කැටයම්වල චක්‍රය මගින් ද මුල් ක්‍රිස්තු වර්ෂ ශතවර්ෂවල කැටයම්වල බුද්ධ රූපය සමඟ චක්‍රය මගින් ද බුදුන් වහන්සේ නියෝජනය කරන ලදි. අනතුරුව බුද්ධ ප්‍රතිමා යුගය වන විට බුද්ධ චරිතයේ වැදගත් අවස්ථාවක් පමණක් ධර්ම චක්‍රයෙන් ඉදිරිපත් විය” (ලගමුව, 1999, පිටුව 145). සමහර ගන්ධාර ප්‍රතිමාවල වම් අත්ලට වඩා දකුණු අත්ල මඳක් ඉහළට වන සේ යොදා දකුණු අතේ සුළඟිල්ල වමතේ මාපටැඟිල්ලෙන් හා දබරැඟිල්ලෙන් මැදි කරගෙන සිටි. අජන්තාවේ එක් චිත්‍රයක දකුණතේ මාපටැඟිල්ල හා දඹරැඟිල්ල මගින් වස්ත්‍රය අල්ලා සිටින වමතෙහි සුළැඟිල්ල ස්පර්ශ කරන ආකාරය දක්වෙන බවත් තවත් චිත්‍රයක එකිනෙකට ස්පර්ශ නොවන පරිදි දෑත සමීපව තබා තිබෙන බවත් ලගමුව සිය අධ්‍යයනයෙන් පෙන්වා දී ඇත. මේ කෙසේ වෙතත් අම්බලන්තොටින් සොයාගත් ප්‍රතිමාව හැරෙන්නට ලංකාව තුළ ධර්මචක්‍ර මුද්‍රාව සහිත බුද්ධ ප්‍රතිමා කිහිපයක් අභයගිරි කෞතුකාගාරයේ දක්නට ලැබේ (අමරසේකර, 2010, 29 පිටුව). එය ද ලංකාවේ නිර්මාණයක් නොවේ. බුද්ධ චරිතයේ විශේෂ අවස්ථා නිරූපිත ප්‍රතිමා ලාංකීය කලාවට විෂයය නොවන නිසා හෝ දේශීය කලා කෘතිවල ඇති සරලත්වය නිසා හෝ ධර්මචක්‍ර මුද්‍රාව මෙරට ශිල්පියාට විෂයයවී නැත.

ධම්ම චක්ක මුද්‍රාවෙන් ප්‍රකාශ කරනු ලබන සන්නිවේදනාර්ථ සංඥාර්ථවේදී විශ්ලේෂණයට අනුව පහත පරිදි ගොනු කර දක්විය හැකිය.

**(Signified) හැඟවුම**



**(Signifier) හැඟවුම්කාරකය**

- කෙළවරක් නොමැති සංසාර චක්‍රය
- අටලෝ දහම
- විශ්වයේ පැවැත්ම පිළිබඳ විද්‍යාත්මක න්‍යාය

**විස්තරය**

මෙම මුද්‍රාවෙන් මූලික වශයෙන් නිරූපණය වන්නේ ප්‍රථම ධර්ම දේශනය හෙවත් ධම්ම චක්ක පවත්වන සූත්‍රයයි. එම සූත්‍රයේ අන්තර්ගත වන අටලෝ දහම හෙවත් දුක - සැප, ලාභ - අලාභ, නින්දා-ප්‍රශංසා, යස-අයස, යන ඒවාට කම්පා නොවී චතුරාර්ය සත්‍ය අවබෝධ කර ගන්නා ආකාරයයි. එනම් දුක, දුකට හේතුව, දුක නැති කිරීම, දුක නැති කිරීමේ මාර්ගය යන්න ය. මෙම මාර්ගයේ ගොස් නිර්වාණ සත්‍ය අවබෝධ කර නොගත් පුද්ගලයාට කෙළවරක් නොමැති සංසාරය චක්‍රයක් මෙන් ආපසු පැමිණෙන බව අවබෝධ කිරීමට උත්සහ ගනී. එම පුළුල් දර්ශනය අවබෝධ කිරීමට මෙම මුද්‍රාව භාවිතවී පවතින ආකාරය, එනම් විශ්වයේ පැවැත්ම පිළිබඳ විද්‍යාත්මක න්‍යාය පිළිබඳ සදාතන දහම ඉන් ප්‍රකාශ කරනු ලැබේ.

**අභය මුද්‍රාව**

සමාධි මුද්‍රාව හැරුණු විට ලංකාවේ බෙහෙවින් ජනප්‍රිය මුද්‍රාව වන්නේ අභය මුද්‍රාවයි. මුල් යුගයේ හිටි පිළිම සෑම එකක් සඳහාම අභය මුද්‍රාව යොදාගෙන ඇත. උඩට නවාගත් දකුණතේ ඇඟිලි දිගහැර අත්ල ඉදිරිපසට පෙනෙන සේ තබාගෙන සිටීම මෙම මුද්‍රාවේ ස්වභාවයවේ. සමහර බුදු පිළිමවල උඩු අතට නවාගත් අත්ල ඇත්තේ හරහටය. අවුකන පිළිමයේ ද දකුණත තෙළා ඇත්තේ එපරිදිය. අභය මුද්‍රාව යැයි වැඩි දෙනෙකු සඳහන් කළද මෙය ආශීෂ හෙවත් ව්‍යාකරණ මුද්‍රාව ලෙස සමහර විද්වතුන් සලකනු ලැබේ. ගන්ධාර සම්ප්‍රදායය තුළ ද මෙම මුද්‍රාව බෙහෙවින් දක්නට ලැබේ. ශාස්තෘවරුන්ට පමණක් නොව දෙවිවරුන්ට ද රජවරුන්ට ද මෙම මුද්‍රාව යොදාගෙන ඇත. ගන්ධාර බෞද්ධ ප්‍රතිමා කලාවේ ප්‍රභවයේ සිට අභය මුද්‍රාව ක්‍රමයෙන් විකාශයවී තිබේ. දකුණතට පමණක් සීමා වන මෙය මුල්ම යුගයේ දකුණු අත්ල උරහිස් දක්වා ඉහළට ඔසවා නිරූපණය කළත් ක්‍රි.ව. 5වන සියවස පමණ වන විට ක්‍රමයෙන් උකුල් මට්ටම ආසන්නය දක්වා පහළට පැමිණ ඇත. පසුකාලීන ගන්ධාර ප්‍රතිමාවල අත්ල පරිවෘත්තව ඇතත් මුල්කාලීන ප්‍රතිමාවල විවෘතව තිබේ. ලංකාවේ ප්‍රතිමාවල අත්ල උරහිස මට්ටම දක්වා උස්ව තිබේ.

"අභය මුද්‍රාව සහිත දකුණු අතත්, සිවුර දරා සිටින වමතත් දීපංකර බුදුන්ට විශේෂ වූ ප්‍රතිමා ලක්‍ෂණ බව ඇතැම්හු හඳුන්වති" (ධම්ම දස්සි හිමි, 2010, පිටුව 53). එමෙන් ම ඉන්දියානු ප්‍රතිමාවේ ඉදිරියට යොමු වූ අත්ල වෙනුවට ලංකාවේ අත්ල වම්පසට යොමුවී ආශීෂ මුද්‍රාවක් නිරූපණය කරනු ලැබේ. මෙය ධර්ම දේශනා ඉරියව්වක් ද විය හැකිය. මෙම මුද්‍රාව බුදුරජාණන් වහන්සේ නාලාගිරි ඇතු දමනය සඳහා අත ඉදිරියට යොමු කිරීම සංකේතවත් කිරීමෙන් ආරම්භ වූවක් යැයි බොහෝ අය තර්ක කරති. "බුද්ධ ප්‍රතිමාවේ දක්වෙන අභය මුද්‍රාව එක් අතකින් සසර බිය දුරු කරන ධර්ම දේශනා ස්වරූපයත්, තවත් අතකින් ආරක්‍ෂාව හා ආශිර්වාදය ලබාදීමත් සංකේතවත් කරන බව ඇතැම් විචාරකයන්ගේ මතයයි" (ධම්ම දස්සි හිමි, 2010, පිටුව 54).

කුමාරස්වාමි ප්‍රකාශ කරන පරිදි නාට්‍ය ශිල්පයේ පතාක හස්තයෙන් නිරූපිත බිය දුරු කිරීම, වියවුලක් සංසිඳවීම, සභාවක් ඇමතීම, දිවුරුම් දීම හා ආශිර්වාද කිරීම යන අදහස් අභය මුද්‍රාවෙන්

ගම්‍ය වෙයි. හින්දු ආචාර විධියකින් අභය මුද්‍රාව ප්‍රභවයවූ බව රාඕ ගේ අදහසයි. රෝමානු මූර්ති කලාවේ ද බහුලව යෙදෙන මෙයින් සෙමිටික් ආගමේ හාස්කම් සහිත ආශිර්වාදයක් නිරූපණය වෙයි. සියලු අතවරවලින් දේව භක්තිකයන් මුදා ගැනීම දේව ප්‍රතිමාවක අභය මුද්‍රාවෙන් පැවසේ. එය විකාශය වූයේ, බලය හා ආධිපත්‍ය පිළිබඳ සංකල්පයක් පදනම් කරගෙන බව ඉන් පෙනේ. සතුන්ට ආරක්ෂාව හා සාමය සලසා දීම මෙයින් ප්‍රකාශ වන්නේ ය. අභය මුද්‍රාව මගින් ආශිර්වාදය සංකේතවත් කරන්නේ යැයි හැවැල් පවසයි. රෝලන්ඩ් ද එම අදහස අනුමත කරයි. (ලගමුව, 1999, පිටුව 143). එමෙන්ම සැනසීම, නිර්භීත භාවය ද ඉන් ජනිත කරවන බව චන්ද්‍රා වික්‍රමගමගේ විසින් දක්වා ඇත. බිය දුරු කළ බුදුන්, බියට පත් අයගේ බිය නැති කිරීමට ද එයින් මඟ පෙන්වයි. "බුදුන් වහන්සේ ජීවත්වූ කාලයෙහි උන්වහන්සේ කෙරෙහි දැඩිලෙස වෛර කළ දේවදත්ත ස්ථවිර උන්වහන්සේ මැරවීමට නාලාගිරි නම්වූ හස්තියා රා කළ සොලොසක් පොවා උන්වහන්සේ වෙත පිටත්කර එවනු" ලැබුවේය. බුදුන් කරා වේගයෙන් පැමිණි හස්තියා දුටු හැම අයෙක් ම ආරක්ෂාව පතා දිව යන්නට විය. එහෙත් බුදුන් වහන්සේ කෙරෙහි දැඩි ස්නේහයෙන් සිටි ආනන්ද හිමි උන් වහන්සේ රැක ගැනීමේ දැඩි අධිෂ්ඨානයෙන් "මේ ඇත් රජු පළමු කොට මා නසාවා යයි" ජීවිතය බුදුරජුන් වෙනුවෙන් පූජා කොට බුදුරදුන් ඉදිරියේ ආවරණයක් ලෙස සිට ගත්හ. එවිට බුදුහු ආන්නද හිමි අමතමින් "ආනන්ද බැහැර යවයි" තුන් වරක් වදාරන තුරු එතැනින් ඉවත් නොවූ බව ද සඳහන්වේ (පෙරමාදුර, 2002, පිටුව 32). රා මදයෙන් මත්ව වේගයෙන් බුදුන් වහන්සේ අබියසට පැමිණෙමින් සිටි ඇත් රජු වෙත, උන්වහන්සේ තම දකුණු අත ඉදිරියට දිගු කොට, මෛත්‍රී පූර්වකව ආශිර්වාද කරන ලදින් නාලාගිරි ඇතා බුදුන් වහන්සේට දමනයවී ඇත. මෙයින් පැහැදිලි වන්නේ බුදුරජාණන් වහන්සේගේ අධ්‍යාත්මික ශක්තිය හා මෛත්‍රීයේ බල මහිමයෙන් නපුරු ගති ඇති හිංසාකාරීන් පවා ජය ගැනීමට උන්වහන්සේට හැකිවූ බවයි. ඒ අනුව "අභය මුද්‍රාවෙන් බුදුරජාණන් වහන්සේ සියලු ලෝ සතුන් කෙරෙහි පතල කරුණා නිධාන වූ ආශිර්වාදමය ගුණෝපේතයන් සනිටුහන් වන්නේය" (පෙරමාදුර, 2002, පිටුව 33).

බුදු දහමට අනුව පෘථග්ජන සත්ත්වයා නිරන්තරයෙන්ම ජාති, ජරා, ව්‍යාධි, මරණ ආදීවූ බියෙන් පෙළෙන බව අපි දනිමු. මෙකී සියලු බිය ඇති වන්නේ සත්ත්වයා තුළ පවත්නා රාග, ද්වේශ, මෝහ ආදී ක්ලේශ ධර්මතා නිසා බව බුද්ධ දර්ශනයේ ම සඳහන්වේ. බුදුන් වහන්සේ මේ සියලු දුක් දොම්නස් හා බිය දුරු කිරීමෙන් නිර්භයත්වයට පත් වී ඇත. සසර භය දුරු කළ උන්වහන්සේ තවත් පැත්තකින් ආශිර්වාදය ලබා දෙන ආකාරය මෙයින් ධ්වනිත කරයි. ධර්ම දේශනය නිරූපණය කිරීම සඳහා චීන හා ජපන් කලාවේ ද අභය මුද්‍රාව යෙදෙයි. "ශිව වැනි දෙවිවරුන්ගේ ප්‍රතිමාවල 'ගැලවුම්කරුවා' යන අදහසින් අභය මුද්‍රාව යෙදෙන බව පෙනේ. සමහරවිට වෙනත් රටවල එම අදහසින් බුද්ධ ප්‍රතිමා සඳහා ද අභය මුද්‍රාව යොදා තිබෙන්නට ඇති නමුත් ලංකාවේ එම අදහස ගම්‍ය නොවේ" (ලගමුව, 1999, පිටුව 144). ආන්ද්‍රා හා මන්කුමාර් හිඳි පිළිම බොහෝමයක මෙම මුද්‍රාව භාවිත වී ඇත. දේශීය සෙල් හිඳි පිළිමවල ඉතා අඩුවෙන් යෙදී තිබෙන අභය මුද්‍රාව ලෝහ හිඳි පිළිමවල ඇත්තේම නැතිමුත් ලෝහ හිටි පිළිමවල ඇත. මෙම ප්‍රතිමාවල අභය මුද්‍රාව ඉන්දීය ප්‍රතිමාවල අභය මුද්‍රාවට අසමානය. මෙහි දකුණු අත්ල මඳක් වම්පසට බර වන සේ යොදා තිබෙන අතර සම්පූර්ණයෙන් ම ඉදිරියට පිහිටා නැත. ලංකාවේ ශෛල ප්‍රතිමා තුළින් මෙම ලක්ෂණය පැහැදිලිව හෙළිදරව් වෙයි. අවුකන පිළිමයේ දකුණු අත්ල වම් පසට සැහෙන පමණ යොමු වී ඇති අතර රුවන්වැලි සෑ විහාරයේ ප්‍රතිමාවේ සම්පූර්ණයෙන් ම වම්පසට යොමුවී තිබේ. වෙනත් සෙල් හා ලෝහ ප්‍රතිමාවල ද දැකිය හැකි මෙම ක්‍රමය මථුරා හිඳි පිළිමවල තිබෙන නමුත් ඉන්දියාවේ දිගටම පැවතී නැත. "නාගපට්ටනම් හා සුල්තාන්ගන්ජ් ලෝහ පිළිමවල ද ගන්ධාර හා මථුරා සෙල් පිළිමවල ද බහුලව දැකිය හැක්කේ දකුණත අත්ල ඉදිරියට යොමු කර තිබෙන බවය" (ලගමුව, 1999, පිටුව 144).

මෙම ක්‍රමය මෙරට සෙල් පිළිමවල කලාතුරකින් යෙදී තිබෙන බව සැස්සේරුව ප්‍රතිමාවේ අත්ල ඉදිරියට යොමු කර තිබීමෙන් පෙනේ. ගඩලාදෙණිය හා කොළඹ කෞතුකාගාරයේ ප්‍රතිමා දෙකේ ඉදිරියට පෑ අත්ල ඇති නමුත් එම දෙකම විදේශීය ලෝහ පිළිම දෙකකි. මේ අනුව අභය මුද්‍රාව සහිත දකුණු අත්ල වමට යොමු කිරීම මෙරට ප්‍රතිමාවල විශේෂ ලක්ෂණයක් බව පැහැදිලි වෙයි. ඉන්දියාවේ බෞද්ධ හා හින්දු ආගමික සංකල්ප හා ප්‍රතිමා ලක්ෂණ සංකලනය වීම නිසා

ප්‍රතිමාවලට එය බලපෑවේය. දෙවිවරුන් හින්දුන් විසින් ස්වකීය ආරක්ෂකයන් හා ගැලවුම්කරුවන් ලෙස සලකා ඔවුන්ගේ ප්‍රතිමාවලට සුදුසු පරිදි ප්‍රතිමා ලක්ෂණ යෙදූ අතර ඒ පදනම මත ඉන්දීය බුද්ධ ප්‍රතිමාවලට ද අභය මුද්‍රාව සහිත අත්ල ඉදිරියට දක්වීම හුරුකරන්නට ඇත. මෙරට ථේරවාද සංකල්ප අනුව බුදුන් සතුන්ට ආශිර්වාද කරන ශාස්තෘවරයකු සේ සළකා දකුණු අත්ල වම් පසට යොමුවූ ආශීෂ මුද්‍රාව සහිත අභය මුද්‍රාව යොදන ලද බව පෙනේ. ඉදිරියට යොමු කළ අත්ල සහිත අභය මුද්‍රාව නිරූපිත ප්‍රතිමා මෙරට ඇතොත් එය ශිල්පීය සම්ප්‍රදායයේ හෝ ශිල්පියාගේ ස්වාධීනත්වය අනුව සිදුවූවක් ද වූ බව පෙනේ. තවත් හේතුවක් නම් අත්ල ඉදිරියට යොමු කරන විට ස්වාභාවිකව දක්වන්නේ නම් අතේ මාංශ පේශීන් ඇඹරී තිබිය යුතුය. එය ලෝහ හෝ සෙල් වැනි ද්‍රව්‍යවල දක්වීමට අපහසුවීම එම හේතුවයි. කෙසේ වුව ද අභය මුද්‍රාව සහිත අත්ල වම් පසට යොමු කර දක්වීම දේශීය කලකරුවාගේ දක්ෂ ස්වයං නිර්මාණයක් ලෙස සැලකිය හැකිය.

අභය මුද්‍රාවෙන් ප්‍රකාශ කරනු ලබන සන්නිවේදනාර්ථ සංඥාර්ථවේදී විශ්ලේෂණයට අනුව පහත පරිදි ගොනු කිරීමට පුළුවන.

**(Signified) හැඟවුම**



**(Signifier) හැඟවුම්කාරකය**

- නාලාගිරි ඇතු දමනය
- සසර භය දුරු කිරීම
- වියවුලක් සංසිඳවීම
- ආශිර්වාද කිරීම
- මහා කරුණාව

**විස්තරය**

මෙම මුද්‍රාව මූලික වශයෙන් නලාගිරි ඇතා දමනය කිරීම හා බද්ධව ඇත. නමුත් මූලික අර්ථය ලෙස අපට භය දුරු කිරීම යන්න මෙහිදි සලකා බැලිය හැකිය. භය යනු සසර බයයි. ලෝකාවාදි පෘථග්ජන සත්ත්වයා නිරන්තරයෙන් ජාති - ජරා - ව්‍යාධි - මරණ ආදී වූ බියෙන් පෙළෙයි. එමෙන්ම රාග - ද්වේශ - මෝහ ආදී ක්ලේශයන්ගෙන් පිරී පවති. මෙම සියල්ලම ප්‍රහීණ තත්ත්වයට පත් කිරීමට හැකි වීම තුළින් සංසාර බය අපට තුරන් කළ හැක. එම සංසාර බය නැති කිරීමට ආශිර්වාද කිරීමක් ලෙස මෙම මුද්‍රාවෙන් සන්නිවේදනය කරනු ලැබේ.

**විතර්ක මුද්‍රාව**

ලංකාවේ ඉතා ස්වල්ප වශයෙන් දක්නට ලැබෙන එහෙත් බොහෝ රටවල්වල බෙහෙවින් ප්‍රචලිත මුද්‍රාවක් ලෙස විතර්ක මුද්‍රාව හැඳින්විය හැකිය. ව්‍යාඛ්‍යාන මුද්‍රාව, ඥාන මුද්‍රාව, සංදර්ශන මුද්‍රාව හා චින් යන නම් ද මෙම විතර්ක මුද්‍රාව වෙනුවට භාවිත කරනු ලැබේ. පපුව මට්ටමට උඩට එසවූ දකුණු අතේ මහපට ඇඟිල්ල තබා කවයක ආකාරයට සැකසී ඇත. මෙහිදී අත්ල ඉදිරිපසට හෝ මඳක් වම්පසට ඇලවී විවෘත විම, අතේ ඇඟිලි තුන සම්පූර්ණයෙන් දිග හැර තිබීම හෝ මඳක් වක්ව තිබීම දක්නට ලැබේ. "ඇතැමෙක් ඉහතින් දක්වන ක්‍රමයට දබර ඇඟිල්ල නවා ඇති තැන ව්‍යාඛ්‍යාන හා සංදර්ශන මුද්‍රා ලෙසත් සුළු වශයෙන් දක්නට ලැබෙන මැදඟිල්ල නමා අත්ල ඇතුළට සිටින ආකාරයේ මුද්‍රාව, ඥාන මුද්‍රාව ලෙසත් හඳුන්වනු ලැබේ" (ධම්ම දස්සි හිමි, 1997, පිටුව 39). විතර්ක මුද්‍රාවේ විශේෂත්වය වන්නේ හිඳි පිළිමවල මෙන්ම හිටි පිළිමවල ද දක්නට ලැබීමයි. ලංකාවේ දැනට ඇති මෙම වර්ගයේ පැරණිතම පිළිමය වන්නේ බදුලු දිස්ත්‍රික්කයෙන් සොයා ගත් දැනට කොළඹ කෞතුකාගාරයේ තබා ඇති ලෝකුරු හිඳි පිළිමයයි. මෙය ක්‍රි.ව. 5-6

වන සියවස්වලට අයත් යැයි සලකනු ලැබේ. දකුණත විතර්ක මුද්‍රාවෙන් ඇති මෙම පිළිමය, මදක් එසවූ වමතින් සිවුරේ වාටිය අල්ලා ගෙන සිටින ලෙස නිර්මාණය කර ඇත. "වියට්නාමයේ ද දැත් මෙලෙසම තබාගෙන ඇති හිටි පිළිමයක් සොයාගෙන ඇත. ජපානයේ විතර්ක මුද්‍රාව යොදා ඇත්තේ අමිතාභ බුදු පිළිමවලින්ය" (අමරතුංග, 1997, පිටුව 44).

විතර්ක මුද්‍රාව හා ඥාන මුද්‍රාව යන්න පිළිබඳ ඒ. ලගමුව දක්වන්නේ වෙනත් ආකාරයේ මතවාදයකි. එනම් "විතර්ක මුද්‍රාව, ඥාන මුද්‍රාවේ ප්‍රතිවිරුද්ධ මුද්‍රාව වන අතර දකුණු අත්ල පිටතට යොමුව තිබේ. ඥාන මුද්‍රාවේදී අත්ල සිරුර දෙසට යොමු වෙයි" (ලගමුව, 1999, පිටුව 151). ඉන්දීය ජනයා විසින් භාවිත කරන විතර්ක මුද්‍රාව එසවූ දකුණතේ මාපට ඇඟිල්ලත් දබර ඇඟිල්ලත් ස්පර්ශවන ආකාරයෙන් කවයක් සාදා නිර්මාණය කර ඇත. මෙය ක්‍රි.ව. 4-5 වැනි ශතවර්ෂවල බුද්ධ ප්‍රතිමා විෂය පිළිබඳ හදාරන්නෙකුට සුලභව දැකිය හැකි ලක්ෂණයක්වේ. ගන්ධාර ප්‍රතිමාවල මැද ඇඟිලි දෙක ද අත්ල මැදට නැමී සිටින ආකාරයට විතර්ක මුද්‍රාව සකසා තිබේ. ලංකාවේ ප්‍රතිමා ශිල්පය තුළ බෝසත් ප්‍රතිමාවල ද ස්වල්ප ලෙස යොදාගෙන ඇත. සිටි හෝ හිඳි ප්‍රතිමා සඳහා ද චිත්‍ර හෝ මූර්ති සඳහා ද ශෛල හෝ ලෝහ මූර්ති සඳහා ද භේදයකින් තොරව යෙදී ඇත.

"බුදුන් වහන්සේ අබියසට පැමිණෙන විවිධ පුද්ගලයන් සමඟ වාද විවාද පැවැත්වූ අවස්ථාවන් සංකේතවත් කරලීමට විතර්ක මුද්‍රාව යොදාගෙන ඇත" (පෙරමාදුර, 2002, පිටුව 35). බුද්ධ චරිතයේ දී උන්වහන්සේ අබියසට පැමිණි විවිධාකාර පුද්ගලයන් මෙන්ම ආගමික නායකයින් සමඟ වාද - විවාදයන්හි යෙදෙමින් නොයෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයමින් කරුණු විග්‍රහ කරමින් සිටි අවස්ථාව මින් නිරූපණයවන බව එහි අදහසයි. එමෙන්ම "මෙම මුද්‍රාවෙන් අෂ්ටලෝක ධර්ම චක්‍රය, සංසාර චක්‍රය, ධර්ම චක්‍රය සංකේතවත්වන බව" (පෙරමාදුර, 2002, පිටුව 35) තවත් මතයකි. මෙම චක්‍ර ලක්ෂණයෙන් බුදුන් වහන්සේගේ ප්‍රඥාව, විශ්ව ශක්තිය පිළිඹිබු කරන බව තවත් මතයකි. "දඹර ඇඟිල්ලත් මහපට ඇඟිල්ලත් තබාගෙන ඇති අන්දමට මැවෙන රවුම බුදු දහමේ සාර්ව භෞමිකත්වය සංකේතවත් කරන බව සොන්ඩර්ස් විසින් දක්වයි" (Sounders, A, 1960, page 66. 75). මහ කරුණා, මහා ප්‍රඥා යන දෙකම එම මුද්‍රාවෙන් සංකේතවත්වේ. විතර්ක මුද්‍රාවෙන් ප්‍රකාශ කරනු ලබන සන්නිවේදනාර්ථ පිළිබඳ තවත් මතයක් වන්නේ, "අයහපත් දේ වෙන් කර යහපත් දේ පමණක් තෙලා ගන්න" (ගමගේ, 1984, පිටුව 84) යන අරුතයි. තෙලා ගත් යමක් රඳවාගෙන සිටින ආකාරය මෙයින් ධ්වනිත කරයි.

විතර්ක මුද්‍රාවෙන් ප්‍රකාශ කරනු ලබන සන්නිවේදනාර්ථ සංඥාර්ථවේදී විශ්ලේෂණයට අනුව පහත පරිදි ගොනු කිරීමට පුළුවන.

**(Signified) හැඟවුම**



**(Signifier) හැඟවුම්කාරකය**

- වාද විවාද පවත්වන අවස්ථාවක් නිරූපණය කිරීම.
- මහා ප්‍රඥාව
- අයහපත් දේ වෙන් කර යහපත් දේ පමණක් තෙලා ගැනීම

**විස්තරය**

බුද්ධ දර්ශනයට අනුව කවුරුත් ප්‍රකාශ කරන දේවල් පිළිගැනීම කළයුතු නැත. එය තර්කානුකූලව විමසා බලා පිළිගැනීමට හා ප්‍රතික්ෂප කිරීමට සැමට අයිතිය හා හැකියාව පවති. එම සනාථන

ධර්මය ප්‍රකාශ කරනු වස් විතර්ක මුද්‍රාව ගොඩනැගී ඇත. වාද විවාද කොට හරි දේ නොඑසේ නම් යහපත් දේ තෝරා බේරා ගැනීමට පවතින මාර්ගය මෙයින් පෙන්නුම් කරයි. එහි අවසන් ඵලය වන්නේ මහා ප්‍රඥාව අවබෝධ කර ගැනීමයි. එය තීරණය කිරීමේ අයිතිය ග්‍රාහකයා සතුවන බවද මෙයින් ධ්වනිත කරනු ලැබේ.

**වරද මුද්‍රාව**

බෞද්ධ පොත්පත්හි වරද මුද්‍රාව වරදාන හා දාන නමින් ද හැඳින්වේ. වරද යනු වරදාන විලාසයෙන් දකුණත පහත් කොට ඇඟිලි දිගහැර අත්ල උඩු අතට හරවා තිබීමවන අතර වමත මැදින් උඩට නමා ඇඟිලි නමා විහිදුවා ගෙන සිටින ආකාරයයි. මේ සියල්ල පිළිබඳව සලකා බලන විට පැහැදිලිවන ප්‍රධාන කාරණයක්වන්නේ ඉන්දියානු ප්‍රතිමාවල විතර්ක මුද්‍රාව මෙන් ලක්දිව ප්‍රතිමාවල විතර්ක මුද්‍රාව සංකීර්ණ නොවන බවයි. ලංකාවේ ප්‍රතිමාවල දබර ඇඟිල්ල හා මාපට ඇඟිල්ල එකතු කර කවය නිර්මාණයවන අතර සෙසු ඇඟිලි ඉතා සුළු වශයෙන් නැමී ඇත. එමනිසා අනෙකුත් ප්‍රතිමා ලක්ෂණ මෙන් විතර්ක මුද්‍රාව දේශීය ස්වරූපයට උචිත පරිදි නිර්මාණය කර ඇති බව පැහැදිලිවේ. ඉන්දියාවේ සුලභව දැකිය හැකි මුද්‍රාවක් ලෙස වරද මුද්‍රාව හැඳින්විය හැකිය. නමුත් ලංකාවේ වරද මුද්‍රාව සහිත බුදු පිළිම අතිශයින්ම දුර්ලභය - දකුණු අත පහළට හෙලා අත්ල ඉදිරියට හරවා ඇඟිලි දිගහැර තබාගෙන සිටින ආකාරය මෙම මුද්‍රාවෙන් නිරූපණයවේ. මෙහිදී ඇඟිල්ල සම්පූර්ණ ලෙස දිග හැරීම ද ඉතා මද ලෙස දිග හැරුණු අවස්ථා ද දක්නට ලැබේ. ඇතැම් විට දකුණු අතේ වෙනත් මුද්‍රාවක් යෙදී වම් අතේ වරද මුද්‍රාව යෙදුණු අවස්ථා ද ඇත. මෙම මුද්‍රාව හින්දු දේව ප්‍රතිමා හා මහායාන බෝසත් ප්‍රතිමා සඳහා බහුලව යොදා ගෙන තිබෙන අතර ටිබැට්, නේපාල වැනි රටවල අවලෝකිතේශ්වර බෝසතුන් සඳහා ද යොදා ගත් ප්‍රසිද්ධ මුද්‍රවකි. නමුත් බුද්ධ ප්‍රතිමා විෂයෙහි එතරම්ම ජනප්‍රිය මුද්‍රාවක් නොවේ. වරයක්දීම බෝධිසත්ව ප්‍රතිමාවලට හා හින්දු දේව ප්‍රතිමාවලට සුදුසු වුව ද බුදුන්ට සුදුසු හෝ අදාළ නොවීම ඊට හේතුව විය හැකිය. "වරද මුද්‍රාවෙන් සංකේතවත් කරන්නේ වර දීම හෙවත් පොරොන් දීම" (අමරතුංග, 1997, පිටුව 45) යන්න එක් මතයකි. ජපන් බෞද්ධ පොත්පත්වල මේ පිළිබඳව සඳහන් වන්නේ ලෝකයාගේ සුවසෙත පිණිස මහා කරුණා ගුණය පතළ කිරීම එයින් මූර්තිමත් කරන බවයි. එමෙන්ම "බුදුරජාණන් වහන්සේගේ දාන පාරමිතාව, පරිත්‍යාගශීලි ගුණය මෙයින් මූර්තිමත් කරන බව" (අමරතුංග, 1997, පිටුව 45) තවත් මතයකි. එය ප්‍රධාන වශයෙන් පැහැදිලි කරනු ලබන්නේ, ථේරවාදි හා මහායාන සම්ප්‍රදායන් දෙකෙහිය. මහායාන බලපෑමෙන් හින්දු ආභාසය ලබා බුදුපිළිමයට එක්වූ මේ මුද්‍රාවෙන් බුදුරජාණන් වහන්සේ සියලු සත්ත්වයා වෙත වරයක් ලබා දෙන බව එයින් සංකේතවත් විය යුතුය. එමෙන්ම "මිනිසුන්ගේ හා දෙවියන්ගේ ප්‍රාර්ථනා ඉටු කර ගැනීමට හෙවත් ඔවුන්ගේ විමුක්තිය සඳහා ධර්මය දේශනා කිරීම මගින් බුදුන් වහන්සේ සිය දානශීලී භාවය අර්ථවත් කරන බව" (වික්‍රමගමගේ, 2006, පිටුව 45) තවත් මතයකි. "විවෘතව අත හා දිග හරින ලද ඇඟිලි සත්‍ය මල්පල ගැන්වෙන බව අඟවයි. අවසාන වශයෙන් විමුක්ති දානය ඉන් අදහස් වෙයි" (Saunders, 1960, page 66).

වරද මුද්‍රාවට අයත් ලාංකීක කලාශිල්පයේ ප්‍රතිමා හමු නොවෙතත් ගඩලාදෙණිය විහාරයේ ඇති ලෝකඩ ප්‍රතිමාවේ වම් අත දක්වා ඇත්තේ වරද මුද්‍රාවෙනි. වරද මුද්‍රාව සහිත තවත් ලෝකඩ බෝධිසත්ත්ව ප්‍රතිමා කිහිපයක් පසුකාලීනව හමුවී ඇත. වරද මුද්‍රාවෙන් යුතු පැරණිතම පිළිමය ලෙස සලකනු ලබන්නේ සාරනාත් කෞතුකාගාරයේ පිහිටි සාරනාත් හිටි පිළිමයයි. අජන්තා ගල් ලෙනක ද වරද මුද්‍රාවෙන් යුතු පිළිමයක් ඇත. නේපාලයේ ස්වයංභූනාත් ප්‍රතිමාවෙන් ද ඉන්දුනීසියාවේ ජාවාහි බොරෝ බුදූර් මහා ස්තූපයේ සතර දිශාවන්හි ඇති පද්මාසනාරූඪ බුදුපිළිම ද, ජපානයේ ගෞතම බුදුන් වහන්සේ හැර වෛරෝචන, අමිතාභ, රත්න සම්භව ආදී බුද්ධ ප්‍රතිමාවල ද වරද මුද්‍රාව නිරූපණය කර ඇත. වරද යන්නෙන් අදහස් කරන්නේ වරයන් දීමයි. "වර" යන්නෙන් උතුම් යන තේරුම දෙයි. "ද" නම් දීමයි. ඒ අනුව උතුම් දෙයක් දීම හෙවත් හොඳ ඉල්ලීමක් ඉටු කිරීම වරදානයක් ලෙස කිව හැකිය. නිවැරදි සාධාරණ ඉල්ලීමකට තම කැමැත්ත, අනුමැතිය ලබා දීම මෙයින් අදහස් කෙරේ. කෙනෙකුගේ යහපත් ඉල්ලීමක් ඉටු කරන බවට කැමැත්ත ප්‍රකාශ කිරීම වර දානය නම්වේ. එම පොරොන්දු දෙවිවරුන් රජවරුන් ආදී

බලවතුන් දෙන අන්දමේ වරදාන නොවේ. එහිදි සිදුවී ඇත්තේ ධර්මයේ පැවැත්ම සඳහා ආනන්ද හිමියන් ඉදිරිපත් කළ යෝජනා කිහිපයක් බුදුරජාණන් වහන්සේ ද ගෞරවයෙන් පිළිගැනීමයි. ථේරවාදී ග්‍රන්ථයන්හි වරදානයක් පිළිබඳව සඳහන් වන්නේ ආනන්ද හිමියන් බුදුන් වහන්සේගේ උපස්ථායක ධුරයට පත්වීමට පෙර වර අටක් ප්‍රදානය කළ අවස්ථාවයි. බුදුන්ගේ මෙම ධර්මතාව දෙවියන් රජුන් මෙන් ආත්මාර්ථකාමීත්වයෙන් හා ඇතැම් විට අසාධාරණ ලෙස රිසි රිසි අයට වර දීමක් නොවන බව ද සැලකිය යුතුය. බුදුන් වහන්සේ එබඳු ගැලවුම්කරුවකු හෝ ඉල්ලන දේ දෙන්නකු හෝ නොව යුක්තිය ධර්මය කියා දෙන හෙවත් ගැළවීමේ මග දේශනා කරන අයෙක් බව මෙයින් ජනිත කරයි. ඉන්දියානු දේව ප්‍රතිමා ශිල්පයේ ප්‍රධාන මුද්‍රාවක් වන මෙය මහායානිකයන් විසින් බෞද්ධ කලාවට උකහාගෙන ඇත.

වරද මුද්‍රාවෙන් ප්‍රකාශ කරනු ලබන සන්නිවේදනාර්ථ සංඥාර්ථවේදි විශ්ලේෂණයට අනුව පහත ආකාරයට ගොනු කල හැකිය.

**(Signified) හැඟවුම**



**(Signifier) හැඟවුම්කාරකය**

- වරදීම හෙවත් පොරොන්දු දීම
- දාන පාරමිතාව
- පරිත්‍යාගශීලි බව
- මිනිසුන්ගේ හා දෙවියන්ගේ විමුක්තිය උදෙසා කටයුතු කිරීම

**විස්තරය**

බුද්ධ දර්ශනය පිළිගැනීම යනු එක්තරා දුරකට පොරොන්දු ලබා දීම ලෙස දැක්විය හැක. බෞද්ධයාගේ නිත්‍ය ශීලයවන පංචශීලය තුළ ද ඇත්තේ අත්හල යුතු නොඑසේ නම් නොකළ යුතු කාරණා 05ක් පිළිබඳ පොරොන්දු ලබාදීමයි. බුද්ධ දර්ශනය අවබෝධ කර ගැනීමෙන් පසු අප හට විවිධ වරයන් වෙනුවෙන් පෙනී සිටීමට කැපවීමට හැකියාව තිබිය යුතුය. එම ප්‍රකාශනාර්ථය සරලව ඉදිරිපත් කිරීමට මෙම මුද්‍රාව යොදා ගෙන ඇති බව පෙනේ.

**භූමිස්පර්ශ මුද්‍රාව**

බුදුන් වහන්සේ මහා පොළොව පහස්නා ආකාරයෙන් තෙළන ලද භූමිස්පර්ශ මුද්‍රාව බද්ධ පර්යංකයෙන් වැඩ සිටින ඉරියව්වෙන් යොදා ගෙන තිබේ. හිස මඳක් පහළට නවා බිම දෙසට හරවාගෙන පහළට හෙලූ දෑසින් යුතුව වම් අත බද්ධපර්යංකය මත අත්ල උඩට සිටින සේ තබාගෙන දකුණු අත දිගු කොට දකුණු පාදයේ දණහිසේ ගැවෙන සේ පොළව දෙසට දිගු කොට ඇඟිලි බිම ගැවෙන නොගැවෙන පමණට සිටින සේ මෙම මුද්‍රාව නිරූපණය කොට ඇත. සාමාන්‍ය ක්‍රමය මෙය වුවත් ශිල්පීන් අනුව උපයෝගීතාවේ යම් යම් වෙනස්කම් දක්නට ලැබේ. බොහෝවිට දකුණු අතේ ඇඟිලි මහා පොළවේ නොගැවී සිටි. හින්දු ග්‍රන්ථවල හෝ ප්‍රතිමාවල නොමැති උතුරු ඉන්දියාවේ ජනප්‍රිය නොවුණු ලංකාවේ දක්නට නැති භූමි ස්පර්ෂ මුද්‍රාව ලාඕස්, ජාවා, ජපානය, කොරියාවේ ද දක්නට ලැබේ. බුද්ධ ප්‍රතිමාවලට හා බෝධිසත්ත්ව ප්‍රතිමාවලට පමණක් ආවේණික වූ මුද්‍රාවක් ලෙස මෙම භූමිස්පර්ශ මුද්‍රාව සලකනු ලැබේ. එමෙන්ම හිඳි පිළිම හෙවත් වැඩසිටින ප්‍රතිමාවල පමණක් දක්නට ලැබෙන මුද්‍රාවක් ද වේ. ශ්‍රී ලංකාවට ආවේණික මුද්‍රාවක් නොවන අතර බුරුමය, සියමය, තායිලන්තය වැනි රටවල බහුලව දක්නට ලැබෙන මුද්‍රාවක් ලෙස සැලකිය හැකිය.

මෙම මුද්‍රාවෙන් සංකේතවත් වන්නේ “මම විශ්වයේ ස්වභාවය ඇතැඹුලක් සේ දැනගතිමි” යන්න බව ආනන්ද කුමාරස්වාමි පවසයි (ගමගේ, 1984, පිටුව 83). රාඕ පවසන අන්දමට භූමිස්පර්ශ මුද්‍රාව

යනු බෝධිසත්වයන් වහන්සේ මාර පරාජය සඳහා බෝධි මූලයෙහි වැඩ හිඳිමින් "මාරය මම තොපට බිය නොවෙමි. පෙර මා විසින් පුරන ලද දානාදී පාරමිතා ධර්මයන්ගේ බල මහිමය නිසා, වෙස්සන්තර රජව සිටියදී පමණක් දන් දුන් දනින් සත්වරක් කම්පාවූ මේ මහා පොළෝ මහී කාන්තාවම මාගේ මේ පෙරුම්දම් පිරීමට සාක්‍ෂියයි. තමන් වහන්සේගේ දක්‍ෂිණ හස්තය පොළවට දිගුකොට මහ පොළව පෙන්වාලූහ. එකෙනෙහිම මහා හඬ නගමින් පොළව කම්පා වූයේය" (පෙරේරා, 2002, පිටුව 34). මෙසේ බුද්ධ ප්‍රතිමාවල, බුදුන් වහන්සේ තම දක්‍ෂිණ හස්තය දිගුකර ඇඟිලිවලින් භූමිය පෙන්වන ආකාරය ප්‍රකාශ කරන්නේ මාරයාගේ තර්ජනයට පිළිතුරක් වශයෙන් පොළෝතලය සාක්‍ෂි බව පෙන්වා දීමටය. වෙස්සන්තර ජාතකයේ දක්වෙන කතා පුවත අනුව කෙලෙස් සතුරන් මැඩ ආත්මභවයේදී දාන පාරමිතා බලය සම්පූර්ණ කිරීමත්, එහි බලයත්, මෙම මුද්‍රාවෙන් ප්‍රකාශවන බව පෙනේ.

භූමි ස්පර්ශ මුද්‍රාව බුදුරජාණන් වහන්සේගේ බෝසත් අවධියේ ත්‍යාගශීලි බව සංකේතවත් කරන බව පොදුවේ පිළිගත් මතයයි. බුද්ධත්වයට පත්වූ සිද්ධාර්ථයන් තමාගේ බෝධිසත්ත්ව චර්යාව සම්පූර්ණවී යැයි ලෝකයාට ඔප්පු කරන අවස්ථාව මෙයින් මූර්තිමත් කරයි. මහනුවර යුගයේ බිතුසිතුවම් අතර දෙගල්දොරුව, හිඳගල හා දඹුල්ල වැනි ලෙන් විහාරවල සිවිලිමේ ඇති විශාල චිත්‍රවල අත්ල උඩුකුරුව ඇති අතර ඇඟිලි භූමියේ ස්පර්ශ නොවේ. ඇතැම්විට දකුණු අත දණහිසෙන් තරමක් ඈත්ව පිහිටා තිබේ. දේශීය බුද්ධ ප්‍රතිමාවල මුද්‍රා හැමවිටම විශේෂ අවස්ථාවක් හෝ අදහසක් ධ්වනිත කිරීම සඳහා භාවිත විය. හිඳගල හා පොළොන්නරුව බිතු සිතුවම්වල බුද්ධ චරිතයේ අවස්ථා නිරූපණයවන දර්ශන තිබෙන නමුත් කැටයම් හෝ මූර්තිවල බුද්ධ චරිතය මුල් කාලය නිරූපණය නොවේ. මේ නිසාම භූමිස්පර්ශ මුද්‍රාව සහිත බුද්ධ ප්‍රතිමා ලංකාවේ ද හිඟ වන්නට ඇත. එමෙන් ම භූමිස්පර්ශ මුද්‍රාව පිළිබඳ මූලික අදහස මහායාන සංකල්පයක් බැවින් කලාකරුවා එය ප්‍රිය නොකරන්නට ද ඇත.

භූමි ස්පර්ශ මුද්‍රාවෙන් ප්‍රකාශ කරනු ලබන සන්නිවේදනාර්ථ සංඥාර්ථවේදී විශ්ලේෂණයට අනුව පහත පරිදි ගොනු කළ හැකිය.

**(Signified) හැඟවුම**



භූමි ස්පර්ශ මුද්‍රාව

**(Signifier) හැඟවුම්කාරකය**

- මම විශ්වය ඇතැඹුලක් සේ දැන ගතිමි.
- මහ පොළොව සාක්‍ෂි බව අවබෝධ කිරීම.

**විස්තරය**

විශ්වය අවබෝධ කරගත් බවට මහපොළොව සාක්‍ෂි බව ප්‍රකාශ කිරීමට භූමිස්පර්ශ මුද්‍රාව යොදාගෙන ඇති බව මින් පැහැදිලිවේ. නමුත් පුළුල්ව අධ්‍යයනය කරන විට එය නිවන යන්න ප්‍රකාශ කිරීමට ඉදිරිපත් කරන සංකේතයක් විය හැකිය.

බුද්ධ ප්‍රතිමාවල පවතින මූලික මුද්‍රා හය වන සමාධි, ධර්මචක්‍ර, අභය, විතර්ක, වරද හා භූමිස්පර්ශ යන මුද්‍රා 06 එකිනෙකට සම්බන්ධතාවක් පවතී. එය රූප සටහනක් ලෙස පහත පරිදි දක්විය හැකිය.




ලංකා සමාජය තුළ ප්‍රධාන වශයෙන් දක්නට ලැබෙන්නේ ඉහතින් විස්තර කර ඇති ප්‍රධාන මුද්‍රා 06 පමණකි. නමුත් ඇතැම් අවස්ථාවල මෙම මුද්‍රාවලට වඩා වෙනස් මුද්‍රා ගණනාවක් ද හමුවී ඇතිබවද දැකිවිය හැකිය.

**නිගමනය**

- ක්‍රියාවන් හා වචන අතර පවතින සම්බන්ධය හා සමාන සම්බන්ධතාවයක්, හස්ත මුද්‍රා හා වචන අතර පවතින බව නිගමනය විය. ඒ අනුව සන්නිවේදන ක්‍රියාකාරීත්වය වර්ධනය කිරීමට හස්ත මුද්‍රා ඉතා මහඟු මෙහෙයක් සිදු කරයි. එය මෙම රූප සටහනෙන් වඩාත් තීව්‍රවේ.

- හස්ත මුද්‍රා **"අන්තර් භාෂිත සංකේත සමුදායක්"** ලෙස අපට හඳුනාගත හැකිය. එහිදී මානව භාෂාව හා හස්ත මුද්‍රා, අන්තර් සංස්කෘතික වශයෙන් පරිණාමීය යාන්ත්‍රණයක් සහිත විෂයය ක්ෂේත්‍රයක් ලෙස දැක්විය හැකිය.

- ඒ අනුව මුද්‍රා සන්නිවේදනය ප්‍රධාන වශයෙන් කොටස් කිහිපයකට බෙදා දැක්වීමට පුළුවන.
  **විස්තරාත්මක මුද්‍රා සන්නිවේදනය**
  **අවධාරණාත්මක මුද්‍රා සන්නිවේදනය**
  **ඵලදායී මුද්‍රා සන්නිවේදනය**
  **තහවුරු කිරීමට මුද්‍රා සන්නිවේදනය**

- සමීපතම සමාජ සංදර්ශනයක් තුළ කායික හා ශාරීරික අංග ලක්ෂණ භාවිත කරමින් සන්නිවේදනය කිරීමට මුද්‍රා සන්නිවේදනය යොදාගතහැකි බව දැක්විය හැකිය. මුහුණට මුහුණලා කෙරෙන සන්නිවේදනය තුළ අභිනය භාවිත කිරීම ඔස්සේ දෘශ්‍ය සන්නිවේදනය සිදුවන අතර අවබෝධය හා භාවිත ක්‍රමය අනුව වටහා ගන්නා ආකාරය වෙනස් වන බවත් මෙහිදී නිරීක්ෂණය විය. ඒ අනුව අවකාශීය තොරතුරු නිශ්චිත අර්ථ විවරණය කර ගැනීමට මුද්‍රා භාවිත කරන බව දැක්විය හැක.

- ප්‍රධාන වශයෙන් සන්නිවේදකයා හා ග්‍රාහකයා යන දෙපාර්ශවයම පොදුවේ සන්නිවේදනය කිරීමේදී හස්ත මුද්‍රා භාවිත කරන බව ගම්‍ය විය. නමුත් එහිදී භාවිත කරන්නාගේ අන්තර්ක්‍රියා හා සංස්කෘතික පදනම මත එම හස්ත මුද්‍රාවල සන්නිවේදනාර්ථ වෙනස්වන බව නිගමනය කළ හැකිය.

## මූලාශ්‍රය


Armstrong, David F. (2007). The Gestural Origin of Language. Oxford. University Press.

Barthes, R. (1968). Elements of Semiology. New York, Hill and Wang.

Ferdinand, Saussure. (1978). Fundamentals of Semiology. New York, Hill and Wang.

අමරතුංග, විජයසිරි. (1997). ශ්‍රී ලංකාවේ චිත්‍ර හා මූර්ති කලා. කර්තෘ ප්‍රකාශනයකි.

අමරසිංහ, මාලිංග. (2004). ලක්දිව සුපතල බුදුපිළිම. මරදාන, ගොඩගේ සහ සහෝදරයෝ.

අමරසිංහ, මාලිංග. (2010). ලක්දිව බුද්ධ ප්‍රතිමාව. කොළඹ, දයාවංශ සහ සමාගම.

ගොඩකුඹුර, චාල්ස්. (1963). සිංහල බුදු පිළිමය. කලා සඟරාව, 10 කලාපය, 1963 මාර්තු. කොළඹ.

ධම්මදස්සි හිමි, දොඩම්කුඹුරේ, (2010). ශ්‍රී ලංකේය බුද්ධ ප්‍රතිමා ලක්‍ෂණ. මරදාන, ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක, විමල්. (2010). නව විචාර සංකල්පඃ ඥාන ක්‍ෂේත්‍රයෙහි ප්‍රවණතා. බොරලැස්ගමුව, විසිදුණු ප්‍රකාශකයෝ.

දේවේන්ද්‍ර, ඩී. ටී. (1967). බුද්ධ ප්‍රතිමාව හා ලංකාව. කොළඹ, ගුණරත්න සහ සමාගම.

රතනසාර ස්ථවිර, තිරාණගම. (1985). ආසියාවේ බෞද්ධ කලා අංක 2 බුදුපිළිම. කොළඹ, සංස්කෘතික කටයුතු අමාත්‍යංශය.

රතනසාර, තිරාණගම හිමි. (1985). ආසියාවේ බෞද්ධ කලා 1. කොළඹ, රජයේ මුද්‍රණාලය.

රාහුල හිමි, වල්පොල. (1989). ලක්දිව බුදු පිළිමයේ ඉතිහාසය. කොළඹ, ගුණසේන සහ සමාගම.

වනරතන, රංජිත්. (සංස්කරණය).(2001). ලීනාර්ථ වර්ණනා සහිත උම්මග්ග ජාතකය. මරදාන, සමයවර්ධන පොත්හල.

වනරතන හිමි, කඹුරුපිටියේ. (1985). ලක්දිව බුදු පිළිමය. මාතර, මාතර වෙලෙන්දෝ.

වනරතන හිමි, කඹුරුපිටියේ. (1990). ශ්‍රී ලංකාවේ කැටයම් හා මූර්ති. කොළඹ, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

වත්තල, සරත්. (1962). කලාව හා ශිල්ප ශාස්ත්‍ර. කොළඹ. ගුණසේන සහ සමාගම.

වික්‍රමගමගේ, චන්ද්‍රා. (1962). ප්‍රතිමා ප්‍රමාණ මූලධර්ම. නුගේගොඩ, කපිල මුද්‍රණ ශිල්පියෝ.

වික්‍රමගමගේ, චන්ද්‍රා. (1990). මූර්ති, කැටයම් කලාව. කොළඹ, පුරාවිද්‍ය දෙපාර්තමේන්තුව.

විජේසේකර, නන්දදේව. (1970). පැරණි සිංහල ප්‍රතිමා ශිල්පය. කොළඹ. ගුණසේන සහ සමාගම.

විමලරතන හිමි, බෙල්ලන්විල. (1991). බුදු පිළිමය, මුද්‍රා හා ආසන. කර්තෘ ප්‍රකාශනයකි.

වික්‍රමගමගේ, චන්ද්‍රා. (2006). ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රතිමා කලාව. මරදාන, ගොඩගේ සහ සහෝදරයෝ.

වීරසිංහ, ටියුඩර්. (2012). ජනමාධ්‍යවේදය, සංහතික මාධ්‍යයන්ගේ සංඥාර්ථවේදය. සංඥාර්ථවේදී ප්‍රවේශය, වෙළුම 03, 2012, හොරණ, මාධ්‍ය පර්යේෂණ අංශය, ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය.

ලගමුව, ඒ. (1999). ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රතිමා ලක්‍ෂණ. පර්යේෂණ ග්‍රන්ථ ප්‍රකාශන ව්‍යාපෘතිය, මධ්‍යම සංස්කෘතික අරමුදල.

සුමනපාල, ගල්මංගොඩ. (1962). ආදි බෞද්ධ දර්ශනය. අභය මුද්‍රණ ශිල්පියෝ.

සෝමරත්න, එච්. එම්.(පරිවර්තන). (1962). මධ්‍යකාලීන සිංහල කලා. කොළඹ, සංස්කෘතික දෙපාර්තමේනතුව.

කඳමුල්ල, සිරිපාල. (1966). බුද්ධ ප්‍රතිමා කලාවේ ආරම්භය, දිනමිණ වෙසක් කලාපය 1966. කොළඹ, සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.

ගමගේ, ධර්මසිරි. (1984). මුද්‍රාවෙන් මතුවන මුනිදහම, දිනමිණ වෙසක් කලාපය 1984. කොළඹ, සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.

ගුණසේකර, විල්ප්‍රඩ් එම්. (1980). බුදු පිළිමය, දිනමිණ වෙසක් කලාපය 1980. කොළඹ, සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.

පෙරේරා, ඒ. ඩි. ටී. ඊ. (1984). ධර්මචක්‍ර මුද්‍රාව, දිනමිණ වෙසක් කලාපය 1984. කොළඹ, සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.

පෙරේරා, ජී.ඇස්. (1979). රටින් රට බුද්ධ ප්‍රතිමා, දිනමිණ වෙසක් කලාපය 1979. කොළඹ, සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.

පෙරේරා, සිරි නිශ්ශංක. (1998). මිනිසුන්ට ශ්‍රේෂ්ඨ වූ නරසීහ වූ ඒ පියා ඔබය, දිනමිණ වෙසක් කලාපය 1998. කොළඹ, සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.

බස්නායක, එච්. ටී. (1965). බුදු පිළිමයේ ඉතිහාසය, දිනමිණ වෙසක් කලාපය 1965. කොළඹ, සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.

මුදියන්සේ, මහාචාර්ය නන්දසේන. (1994). මෛත්‍රී බෝධිසත්ත්ව ප්‍රතිමා, කලා සඟරාව, 15වන කලාපය. කොළඹ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

මුදියන්සේ, මහාචාර්ය නන්දසේන. (19996). බුදු පිළිමය, වෙසක් කලාපය, කොළඹ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

මුදියන්සේ, මහාචාර්ය නන්දසේන. (1979). සිංහල බෞද්ධ මූර්ති ශිල්පය, දිනමිණ වෙසක් කලාපය 1979. කොළඹ, සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.

බස්නායක, මහාචාර්ය එම්. ටී. (2005). ප්‍රතිමා වන්දනාවේ ආරම්භය පිළිබඳ විමර්ශනයක්, කලා සඟරාව, කොළඹ, ශ්‍රී ලංකා කලා මණ්ඩලය.

රත්නායක, නයන තිලක්. (1986). බෞද්ධ සංකේත, දිනමිණ වෙසක් කලාපය 1986. කොළඹ, සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.

රෙපරමාදු, ලීලා (සංස්). (2002) බෞද්ධ සංස්කෘතික ලේඛන. කොළඹ, සංස්කෘතික දෙපාර්තමේන්තුව.

ලක්දුසිංහ, සිරිනිමල්. (1974). ප්‍රතිමා කලාව, දිනමිණ වෙසක් කලාපය 1974. කොළඹ, සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.

ලක්දුසිංහ, සිරිනිමල්. (1983). බෞද්ධ කලාව හා හින්දු දෙවිවරු, දිනමිණ වෙසක් කලාපය 1983. කොළඹ, සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.

සුමනජෝති, පල්ලන්තර නාහිමි. (1999). බුද්ධ ප්‍රතිමාවන්හි මුද්‍රා මගින් දැක්වෙන සන්නිවේදනය, නිවන් මඟ, 36 වන කලාපය, කොළඹ, රජයේ මුද්‍රණාලිය බෞද්ධ සංගමය.